# සංක්ෂිප්තය


ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරුවරයාගේ සූදානම නොමැති වීම පන්ති කාමර කළමනාකරණයට කරන බලපෑම කෙබඳුද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය විය. අධ්‍යයන කාර්යය ආරම්භයේදී ගැටළුව සවිස්තරව හඳුන්වා දීමත් ගැටළුවේ පසුබිම පැහැදිලි කිරීමත් සිදු කෙරිණි.අධ්‍යයන ක්‍රම පිළිවෙත සහ අධ්‍යයනයේ සීමා දැක්වීමත් පද අර්ථකථන ඉදිරිපත් කිරීමත් අනතුරුව ඉදිරිපත් කර ඇත. අධ්‍යයන ක්ෂේත්‍රය ආවරණය වන ලෙස පර්යේෂිකාව විසින් සැකසූ සංකල්ප රාමුව සහ කාලීන වශයෙන් මෙවන් අධ්‍යයනයක් සිදු කිරීමේ ඇති වැදගත්කමත් නිබන්ධනයේ සමස්ථ සැලැස්මත් ආදී වශයෙන් පර්යේෂනයේ මූලික සැලසුම ඉදිරිපත් කර ඇත.

පර්යේෂණ ක්ෂේත්‍රයට අදාල සාහිත්‍ය විමර්ශනය යටතේ පන්ති කළමනාකරණයට බලපාන ගුරුවරයාගේ සූදානම පිළිබඳව ඍජුවම නැතත් අධ්‍යයනයේ තොරතුරු සාකච්ඡාවට පදනමක් වශයෙන් පන්ති කළමනාකරණය පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ විමසා බැලූ කරුණු අන්තර්ගත කෙරිණි. ඒ යටතේ සාහිත්‍ය විමර්ශනය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත විණි. න්‍යායාත්මක තොරතුරු යටතේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරුවරයාගේ සූදානම විමසා බැලීමත් පන්ති කළමනාකරණයේදී ගුරුවරයාගේ කාර්ය භාරය කෙබඳු විය යුතු දැයි විමසා බැලීමත් පන්ති කළමනාකරණ ක්‍රම ශිල්ප විමසීමත් සිදු කර ඇත. පර්යේෂණ ආශ්‍රිත තොරතුරු යටතේ දේශීය සහ විදේශීය පර්යේෂණ තොරතුරු අධ්‍යයනයට අදාල වන සේ සාහිත්‍ය විමර්ෂණය යටතේ විමසා බැලීමට ලක් කෙරිණි .

පර්යේෂණය දියත් කෙරන පර්යේෂණ ක්‍රමවේදය සවිස්තරව ඉදිරිපත් කිරීම අනතුරුව සිදු කෙරුණු අතර ඒ යටතේ පළමුව පර්යේෂණ ප්‍රවේශය පිළිබඳව සඳහන් කර ඇත. නියැදිය සහ නියැදිය තෝරා ගත් ආකාරය යටතේ කළුතර දිස්ත්‍රික්කයට අයත් කළුතර අධ්‍යාපන කලාපයේ කළුතර, පානදුර, බේරුවල සහ දොඩම්ගොඩ යන අධ්‍යාපන කොට්ඨාස හතරම නියෝජනය වන ලෙසත් පාසල් වර්ගීකරණයට අයත් ස්ථර හතරම නියෝජනය වන ලෙසත් පාසල් 10 ක් තෝරා ගැනිණ. ප්‍රාථමික අංශයට සුවිශේෂීව මෙම අධ්‍යයනය සිදුකළ නිසා ප්‍රාථමික අංශයේ 3 සහ 4 ශ්‍රේණි වල පන්ති කාමර 30 ක් ද නිරීක්ෂණය කරන ලදී. එසේම එම පන්ති කාමර වල ඉගැන්වීම් අවස්ථා 30 ක් ද නිරීක්ෂණය කරන ලදී. ගුරුවරු 30 දෙනෙකුට ප්‍රශ්නාවලිය ලබා දුන් අතර ප්‍රශ්නාවලිය මගින් ලද තොරතුරු වඩාත් තහවුරු කිරීම සඳහා නියැදියට අයත් පාසල් වල විදුහල්පතිවරුන් සමග කෙටි සම්මුඛ සාකච්ඡාවක්ද පවත්වන ලදී. පර්යේෂණ උපකරණ සකස් කිරීම යටතේ ප්‍රධානවම ප්‍රශ්නාවලිය සකස් කර ගැනීම සඳහා නියාමක පරීක්ෂණයක් පැවැත් වු අතර පසුව අවසාන ප්‍රශ්නාවලිය සකස් කර ගැනීම සිදු විය.

පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීම ප්‍රධාන කොටස් දෙකක් යටතේ සිදු කෙරිණි. ඒ යටතේ "අ" කොටස මගින් ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දුන් ගුරු නියැදියේ පසුබිම් විස්තර ඉදිරිපත් කර ඇත. "ආ" කොටස මගින් ප්‍රශ්නාවලිය සහ නිරීක්ෂණය මගින් ලබා ගත් සමස්ත තොරතුරු ඉදිරිපත් කිරීම සහ අර්ථකථනය කිරීමත් අධ්‍යයනයේ සුවිශේෂී ගැටළු වලට අනුව දත්ත ඉදිරිපත් කිරීමත් අර්ථකථනය කිරීමත් සිදු කර ඇත.

අවසාන වශයෙන් පර්යේෂණය තුළින් එළඹි නිගමන වූයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුලින් යෝජිත ආකාරයට ප්‍රාථමික පන්ති කාමරයේ සැකැස්ම පවත්වාගෙන යාමට කටයුතු කර ඇති ආකාරයේ සතුටුදායක තත්වයක් දැකිය නොහැකි විය. ගුරුවරුන්ගේ වෘත්තිය පිළිබඳව තෘප්තිමත් භාවය උසස් මට්ටමක විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සූදානම ඇති කර ගැනීම කෙරෙහි බාහිර සාධක එතරම් බලපෑම් සහගත වී නොමැති බවත් ගුරු වෘත්තිය කෙරෙහි පවතින නිසඟ ලැදියාව මත සේවය කෙරෙහි බහුතර ගුරුවරු ප්‍රමාණයක් යොමුව සිටි බවත් නිගමනය කළ හැකි විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදුණු අවස්ථාවේදී පන්ති කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථකව ඉටු වූ බවක් දැකිය නොහැකි විය.